# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 144/10 — 1975 ජනවාරි 01 වැනි බදාදා — 1975.01.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය ; එක්ස් 37/66.

මහා නගර සභා ආඥාපනත

ආඥාව

1974 අංක 8 දරන පනතින් අන්තිමට සංශෝධිත (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 277 වන වගන්තියේ (2) (අ) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජනාධිපති විලියම් ගොපල්ලව වන මම, මහනුවර මහා නගර සභාව පිළිබඳව විශේෂ කොමසාරිස්වරයෙකු පත් කිරීම සම්බන්ධයෙන් 1970 සැප්තැම්බර් මස 14 වන දින අංක 14,923/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවෙන් සංශෝධිත 1970 සැප්තැම්බර් මස 4 වන දින අංක 14,921/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවෙහි " උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් මුතු බණ්ඩාර සමරකෝන් මහතා විශේෂ කොමසාරිස් විය යුතුය " යන වචන වෙනුවට " අබේරත්න බණ්ඩා දමුණුපොල මහතා විශේෂ කොමසාරිස් විය යුතුය " යන වචන ආදේශ කිරීමෙන් එකී ආඥාව මෙම ආඥාවෙන් තව දුරටත් සංශෝධනය කරමි.

වී. ගොපල්ලව,
ජනාධිපති.

1975 ජනවාරි මස 1 වන දින,
මහනුවර දීය.

1–306


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1 A—ජ. 11724—4,275 (74/12)